ශ්‍රී ලංකාවේ ගමන්මග වෙනස් කළ

# විදේශීය ආක්‍රමණිකයෝ




අජිත් තලවත්ත

WASANA PUBLICATIONS

.9301
THA

LIBRARY RAJARATA UNIVERSITY OF SRI LANKA MIHINTALE
LN

# ශ්‍රී ලංකාවේ ගමන් මඟ වෙනස් කළ විදේශීය ආක්‍රමණිකයෝ

RAJMNLIB
78773

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 78773 |
| වර්ග අංකය | 954.9301 THA |

අජිත් තලවත්ත

## හැඳින්වීම

මෙම කෘතිය මඟින් ශ්‍රී ලංකාවට මුල් අවධියේ සිට එල්ල වූ විදේශ ආක්‍රමණ නිසා මෙරට ගමන් මඟ වෙනස් වූයේ කෙසේ දැයි විමර්ශනයට ලක්වේ. ආර්ය සංක්‍රමණයට පෙර මානව ශිෂ්ටාචාරයක් පැවති බව පාහියන්ගල, බටදොඹලෙන සහ ඉබ්බන්කටුව යනාදී ස්ථාන ආශ්‍රයෙන් දැනට සිදුකර ඇති පුරා විද්‍යාත්මක පර්යේෂණ මඟින් අනාවරණය වී තිබේ.

විදේශිකයෝ ඔවුන්ගේ සභ්‍යත්වය හා සමකාලීන ජන සමාජය මෙරට ස්ථාපිත කොට දේශීය සමාජය නොසලකා හැරියහ. ආර්ය සංක්‍රමණ මඟින් නව ජනපද ඇතිකර ඉන්දියානුවෝ තම පිළිවෙත් ප්‍රචලිත කළහ. නමුත් ක්‍රි.පූ. තුන්වන සියවසේ සිදුවූ මිහිඳු මහ රහතන් වහන්සේගේ ආගමනයෙන් පසුව ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද බුදු දහම මෙරට ජනතාවගේ සිතුම් පැතුම් මෙහෙයවන ප්‍රමුඛ බලවේගය බවට පත් විය. ආර්ය සභ්‍යත්වය ක්‍රමික ලෙස විකාශනය වුවද බුදු දහමේ ආශිර්වාදය තුළින් නව දේශපාලන, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික පසුබිමක් ගොඩනැගී, එදා සිට අද දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.

ක්‍රි.පූ. සමයේ සිට දකුණු ඉන්දියානුවෝ මෙරට වරින්වර ආක්‍රමණය කිරීම ආරම්භ කළහ. 16 වන සියවසෙන් පසුව බටහිර ජාතීන්ගේ ආක්‍රමණයන් ද කැපී පෙනේ. දකුණු ඉන්දියානු බලපෑම තුළින් මෙරට දේශපාලන ක්‍රමයේ ස්ථාවර භාවය පිරිහුණු අතර රජරට සභ්‍යත්වයේ පිරිහීමට ද එය ප්‍රධාන වශයෙන් ඉවහල් විය. මොවුන්ගේ අනන්‍යතාවය ආර්ථික, සමාජ හා සංස්කෘතික යන අංශවල තවදුරටත් විද්‍යමානව පවතී. ඉන්දියානු බලපෑම දේශීයත්වයේ පරිහානියට හේතු වූයේ මඳ වශයෙනි. බටහිර ජාතීන්ගේ ආක්‍රමණ ශ්‍රී ලංකාවේ ගමන් මඟ සැලකිය යුතු ලෙස වෙනස් කිරීමට සමත් විය.

පුරාතන පාලනය සැකසී තිබුණේ පියෙකු තම දරුවන් රැකබලා ගන්නා ආකාරයෙනි. බටහිර ජාතීන් මෙම ක්‍රමය වෙනස් කර හමුදා ප්‍රධානියෙකු හෝ ආණ්ඩුකාරවරයකු යටතේ පාලන කටයුතු මෙහෙයවීමත් සමග පාලක හා පාලිත සමාජය ක්‍රමයෙන්

දුරස්ථ විය. ස්වයංපෝෂිත කෘෂිකාර්මික ආර්ථික ක්‍රමයක් මත පුරාතන ආර්ථිකය සැකසුණේ ය. එනමුත් බටහිර ජාතීන්ගේ ආගමනයත් සමග අපේ රටේ කෘෂිකාර්මික සමාජ ආර්ථික පරිසරයට වතුවගාව මූලික කරගත් ආර්ථිකයක් ගොඩනැගුණේය. අධිරාජ්‍යවාදීන්ට අවශ්‍ය වූයේ ස්වයංපෝෂිත ආර්ථිකයක් වෙනුවට ඔවුන්ගේ කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයන සහ නිමි භාණ්ඩ විකිණීමට යෝග්‍ය පසුබිමක් සකසා, ආනයන හා අපනයන ආර්ථිකයක් බවට මෙරට ආර්ථිකය පත් කිරීමටය. දේශීයන්ගේ ඉඩකඩම් මුඩුබිම් පනත් මඟින් ලබාගෙන වැවිලි ආර්ථිකය ඇති කිරීමත් සමග ශ්‍රම වෙළෙඳපොළෙහි හිඟයක් ඇති විය. එයට පිළියමක් ලෙස දකුණු ඉන්දීය ද්‍රවිඩ කම්කරුවන් ගෙන්වා මෙරට පදිංචි කිරීම නව සමාජ ප්‍රශ්න ඇති වීමට ද හේතුවිය. උතුම් සාරධර්ම මත ගොඩනැගී පැවති සිංහල සමාජය විදේශීය ආභාසය මත සංකර වූ පිළිවෙත් වැලඳ ගත්තේය.

විදේශ ආක්‍රමණ නිසා ඇති වූ බලපෑම ගැන විවිධ විද්වතුන් පර්යේෂණ සිදුකර ඇතත් ඈත අතීතයේ සිට නූතනය දක්වා සිදුවූ ආක්‍රමණ පිළිබඳව එතරම් දුරට අධ්‍යයනය කර නොමැති බව පෙනේ. මෙම කෘතියේ පළමු පරිච්ඡේදය මඟින් ආක්‍රමණ සහ සංක්‍රමණ ක්‍රියාවලිය හඳුනා ගැනීමට උත්සාහ ගනී. සෙසු පරිච්ඡේද මඟින් ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම, ආර්ය ජනාවාසකරණය සහ සෙසු බලපෑම්, දක්ෂිණ භාරතීය ආක්‍රමණ හා බලපෑම, බටහිර ජාතීන්ගේ ආක්‍රමණ සහ ප්‍රතිඵල පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කරනු ලැබේ.

අජිත් තලවත්ත

නො.302/2,
ගුරුගම,
මුරුතලාව.
දු.ක. 060-2813633

## පෙළගැස්ම


1. සංක්‍රමණ සහ ආක්‍රමණ හඳුනා ගැනීම ................ 09
2. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම ......................... 11
   රට අභ්‍යන්තරයේ පිහිටීම
3. ශ්‍රී ලංකාවට ආර්ය සංක්‍රමණිකයන් පැමිණීම ........ 18
   ශ්‍රී ලංකාවේ ආර්ය ජනපද
   ආර්ය සංස්කෘතිය සිදු කළ බලපෑම
4. ශ්‍රී ලංකාවට එල්ල වූ දක්ෂිණ භාරතීය ආක්‍රමණ .... 30
   අනුරාධපුර රාජධානි සමය
   පොළොන්නරුව රාජධානි සමය
   නිරිත දිග රාජධානි සමය
5. ද්‍රවිඩ ආක්‍රමණ නිසා ඇති වූ ප්‍රතිඵල ................. 50
   දේශපාලනික බලපෑම
   ආර්ථික බලපෑම
   සමාජීය හා සංස්කෘතික බලපෑම
   කලා ශිල්ප කෙරෙහි ඇති වූ බලපෑම
   සාහිත්‍ය සහ සමාජ ක්ෂේත්‍රයට සිදුවූ බලපෑම
   ආගමික අංශයට සිදුවූ බලපෑම
6. බටහිර ජාතීන්ගේ ආක්‍රමණ ............................. 63
   පෘතුගීසි ජාතිකයන්ගේ ආක්‍රමණය
   ලන්දේසි ජාතිකයන්ගේ ආක්‍රමණය
   ඉංග්‍රීසි ජාතිකයන්ගේ ආක්‍රමණය
7. බටහිර ජාතීන්ගේ ආක්‍රමණ තුළින් ඇතිවූ ප්‍රතිඵල... 77
   දේශපාලන බලපෑම
   ආර්ථික බලපෑම
   ආගමික සහ සංස්කෘතික බලපෑම

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්වීම්
භාෂාවේ වර්ධනය
සාහිත්‍ය සහ කලා කටයුතු
සාමාජීය බලපෑම
විවාහ කටයුතුවල වර්ධනය
ගෘහ භාණ්ඩ හා ආහාර වර්ග
ඇඳුම් පැලඳුම්වල වෙනස්වීම හා මත්පැන් භාවිතය
වෛද්‍ය සේවයේ පිබිදීම
නීති ක්‍රමයේ වර්ධනය

**8. නිගමනය ........................................................... 127**